ආඛ්‍යාන narrations
**Volume 05 | Issue 02 | 2020 | Article 01**
**ISBN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk



# පැරණි ශ්‍රී ලංකාවේ පැවති රාජකාරි ක්‍රමය[1]

එම්. ඒ. එස්. ආර්. සන්ජීවි මන්ත්‍රීරත්න[2]
smanthrirathnr@yahoo.com

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකේය රාජ්‍යත්වයත් සමග බැඳී පවතින ප්‍රමුඛ කාරණයක් වන්නේ රාජකාරි ක්‍රමයයි. එය රාජ්‍ය පවත්වාගෙන යාමට අවශ්‍ය ධනය හා ශ්‍රමය සම්පාදනයේ ප්‍රධානතම මාර්ගය ලෙසද හැඳින්ව ගත හැකිය. මෙම රාජකාරි ක්‍රමය විව ස්වරූප ගත්බව ඉතිහාසය පිරික්සන විට පෙනී යයි. මෙම පත්‍රිකාව ඔස්සේ සාකච්ඡා කෙරෙනුයේ මෙකී රාජකාරි ක්‍රමයේ හැඩතල පිළිබඳවයි.

**ප්‍රමුඛ පදඃ** ඉඩම් භුක්තිය, රදළවරුන්, අනිවාර්ය සේවා, භූපති

## රාජකාරි ක්‍රමය හැඳින්වීම

පැරණි ශ්‍රී ලංකාවේ සමස්ත දේශීය, සමාජ ආර්ථික, දේශපාලන, ආගමික, සංස්කෘතික ක්‍රමය පිළිබඳව විමසා බැලීමේදී අවධානය යොමු විය යුතු විවිධ අදහස් කිහිපයක්ම ඇත. එක් අදහසක් වනුයේ ''රජතුමාගේ කාර්ය යන අර්ථය ඇති රාජකාරිය යන වචනයෙන් අදහස් කරන්නේ යම්කිසි පුද්ගලයෙකු විසින් හෝ ඉඩමක් උදෙසා හෝ පෞද්ගලික සේවය ඉටු කිරීම මගින් මුදලින් නැතහොත් ද්‍රව්‍යයකින් ගෙවිය යුතු නිස්සය''. එහිදී රාජකාරිය යන්නෙන් තෙවැදෑරුම් සේවයක් අදහස් කරන බව පෙනේ. එනම්,

1. කත්තල් රාජකාරිය යනුවෙන් රජතුමාට ගෙවිය යුතු ධාන්‍ය බද්ද,
2. යුද්ධ අවස්ථාවලදී හෝ ජාතික හදිසි අවස්ථාවලදී ඉටුකළ යුතු විශේෂ පෞද්ගලික රාජකාරිය,

[1] භාෂා සංස්කරණයඃ නාලක ජයසේන
[2] Senior Lecturer, Department of History and Archaeology, University of Sri Jayewardenepura Sri Lanka

3. ඉඩම් භුක්තිය සලකා ගෙන රජතුමාට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පෞද්ගලික රාජකාරියකින් හෝ මුදලින් හෝ ද්‍රව්‍යයකින් ගෙවන බද්ද යනුවෙනි.[3]

තව අදහසක් වන්නේ රජු වෙනුවෙන් කළ යුතු සේවය රාජකාරියයි. මේ සේවය ඉඩම් මත පැවති හෙයින් රජුට පමණක් නොව රජුගෙන් ඉඩම් ලබා සිටි නින්දගම් හිමියන්ට හා රදළවරුන්ටද විහාරවලට හා දේවාලවලටද කෙරුණ සේවය රාජකාරියයි. මෙම රාජකාරියද තෙවැදෑරුම් වේ.

එනම්,

1. කන්හාල් රාජකාරිය යනුවෙන් රජතුමාට ගෙවිය යුතු ධාන්‍ය බද්ද,

2. රජුට හෝ රජුගෙන් ඉඩම් ලබා සිටි අයට තම රක්ෂාව අනුව, වසරකට නියමිත දින ගණනක් නොමිලේ සේවය කිරීම හෝ ඒ වෙනුවට මුදලක් හෝ භවභෝග ගෙවීම.

3. ජාතික උපද්‍රවයක් හෝ යුද්ධයක් එළඹි විට විශේෂ සේවා කිරීම යනුවෙනි.[4]

රාජකාරි ක්‍රමය පිළිබඳව ඉදිරිපත් කරන ලද විවිධ අර්ථකථන අනුව රාජකාරිය යනු ඉඩම් භුක්තිය සහ අනිවාර්ය සේවා ක්‍රියාත්මක වන ක්‍රමය හඳුන්වන පදය යනුවෙන් ද නිර්වචනය කොට ඇත.[5] එය අනුවද පහත දැක්වෙන පරිදි රාජකාරිය සේවාව කොටස් කිහිපයකින් යුක්ත වූ බව කියැවේ.

1. යුද්ධ කාර්යය සඳහා හෝ කිසියම් පොදු කටයුත්තක් සඳහා හෝ නියමිත දින ගණනක් අනිවාර්යයෙන් නොමිලයේ සේවය කිරීම එක අංශයකි. ආදි කාලයේදී මෙම දින ගණන පිළිබඳව නිශ්චිත සාධක නැතත් බ්‍රිතාන්‍ය පාලන සමය වන විට එය දින 14 කි.

2. පුද්ගලයන්ගේ කුලය පදනම් කොට ගෙන රජුට හෝ විහාර දේවාල ගමකට හෝ කළයුතු වූ සේවාව.

3. වාර්ෂික ඉඩම් බද්ද හෙවත් රජුට හෝ විහාර දේවාලවලට භාණ්ඩ වලින් හෝ දැකුම් වශයෙන් හෝ ගෙවූ කද රාජකාරිය යනුවෙන් කොටස් තුනක් විය.[6]

රාජකාරිය යනු කුමක්ද යන්න හැඳින්වීම සඳහා ඉදිරිපත් කොට ඇති තව අදහසක් වනුයේ රජුගේ සේවය වශයෙන් නියම ලෙස පරිවර්තනය කළ හැකි රාජකාරිය යනු රජු සතු යම්

---

[3] පීරිස්, රැල්ෆ්, සිංහල සමාජ සංවිධානය, මහනුවර යුගය, කොළඹ, 1964, 89 පිටුව.

[4] විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල, තුන්වැනි කාණ්ඩය, කොළඹ, 1963, 395-396 පිටු.

[5] ද සිල්වා, එම්.යූ. ලංකා සිවිල් සේවාවේ ඉතිහාසය, අභය මුද්‍රණය, 1994, 6 පිටුව.

[6] එම.

ඉඩමක් භුක්ති විඳීම වෙනුවෙන් මුදලින් හෝ හවභෝග මගින් රජුට ගෙවිය යුතු බදු හෝ ඉටුකළ යුතු පෞද්ගලික සේවයයි.[7]

යථෝක්ත නිර්වචන කිහිපය දෙස බලන විට ඉඩම් භුක්තිය සහ සේවාව අතර ඍජු සම්බන්ධතාවයක් පැවති එක්තරා බදු ක්‍රමයක් රාජකාරිය ලෙස හැඳින් වූ බව පෙනේ. සියලු ඉඩම්වල හිමිකරු වූ රජුට පමණක් නොව රජුගෙන් ඉඩම් ලබා සිටි නින්දගම් හිමියන්ටද විහාර හා දේවාලවලටද එකී ඉඩම් භුක්ති විඳින ලද පුද්ගලයන් විසින් ඉටු කරනු ලබන සේවය රාජකාරිය ලෙස හැඳින්විය හැකිය.

රාජකාරිය දෙවියන්ගේ කාරියටත් වඩා ලොකුය.[8] යන සිංහල ප්‍රස්තා පිරුළක් අනුව රාජකාරිය ක්‍රමයෙහි වැදගත්කම ගම්‍යමාන වෙයි. රාජකාරිය ක්‍රමය යන්න නිර්වචනය කළ ඉහත දැක්වූ වර්ගීකරණය දෙස බලන විට රාජකාරිය ක්‍රමය ප්‍රධාන කොටස් දෙකකට වර්ග කිරීම වඩා නිවැරදි වෙයි.

එනම්,

1. ඉඩම් භුක්ති රාජකාරිය ක්‍රමය
2. අනිවාර්ය සේවා රාජකාරිය ක්‍රමය[9] යනුවෙනි.

මේ අතරින් ඉඩම් භුක්ති රාජකාරිය ක්‍රමයෙහි පදනම වූයේ දිවයිනේ තිබූ සියලුම ඉඩම් 'භූපති' වශයෙන් හැඳින් වූ රජුට අයිති බව පිළිගැනීමය. රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ එම ඉඩම්වලින් ලැබෙන ආදායමයි. එහිදී රජු විසින් ඔහුට අවශ්‍ය සේවය සැපයූ අයට වේතන වශයෙන් ලබා දුන්නේ ඉඩම් ය. සේවා පරවේණි වශයෙන් හැඳින් වූ එම ඉඩම් භුක්ති විඳි අය එම ඉඩම භුක්ති විඳිම වෙනුවට රජුට සේවය සපයන ලදි. මෙය ඉඩම් භුක්ති රාජකාරිය ක්‍රමය යනුවෙන් හැඳින්වේ.

අනිවාර්ය සේවා රාජකාරිය ක්‍රමය යටතේ වැඩිහිටි පිරිමි සියලු දෙනා වසරකට නියමිත දින ගණනක් රජුට නොමිලේ සේවය සැපයිය යුතු විය. මේ ක්‍රමය යටතේ ලබාගත් ශ්‍රමය ගම්සභාව හා ගම් මුලාදෑනින් විසින් මෙහෙය වූ අතර, එම ශ්‍රමය සැපයූ ජනතාව වාසය කළ ගම්වල වැව්

---

[7] ඩොයිලි, ජෝන්, සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳව ලුහුඬු සටහන්, කොළඹ, 1966, 50 පිටුව.

[8] Reberts Micheal & L.A. Wickramarathne Export in the nineteenth century in University History of Ceylon, Vol. III, p. 60.

[9] ඇඳගම, එම්. බ්‍රිතාන්‍යයින් යටතේ ශ්‍රී ලංකාවේ සාමාජීය හා ආර්ථික වර්ධනයේ පදනම, ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය, සෝමරත්න, ජී.වී.පී. සංස්කරණය, කොළඹ, විශ්වවිද්‍යාලයේ දේශපාලන විසා අංශයේ ප්‍රකාශනයකි. 1997, 187 පිටු.

අමුණු ඇළ වේලි සහ පාරවල් ප්‍රතිසංස්කරණය කිරීම වැනි පොදු වැඩ සඳහා යොදවන ලදි.[10] ගම පවුල කුලක්‍රමය වැනි සාධක ද ගසට පොත්ත මෙන් රාජකාරිය ක්‍රමය සමඟ බැඳී පැවතීම විශේෂ ලක්ෂණයකි.

අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පැවතියේ රාජාණ්ඩු ක්‍රමයකි. විශේෂයෙන්ම ඉන්දියානු ආභාසයෙන් පෝෂණය වී බුද්ධාගමේ බලපෑමට ලක්ව ශ්‍රී ලංකාවටම ආවේණික ආරකට අනුව මෙම ක්‍රමය වර්ධනය විය. මෙහිදී ශ්‍රී ලාංකිකයාට වඩාත් ප්‍රිය මනාප වූයේ ගොවිතැන මුල් කොට ගෙන නැගුණු ස්වයංපෝෂිත ආර්ථිකයක් හා බැඳුණු සමාජ ක්‍රමයකි. ගොවි තැනටම යෝග්‍ය වූ ස්වභාවික භූමිය ප්‍රධාන ධන උල්පත වූයේය. රජයට පුරවැසියන් විසින් ගෙවිය යුතු ආදායම් හා අයභාරය ද විවිධ සේවා ද රඳා පැවතුණේ සාමූහිකව වගා කළ ඉඩම් කට්ටි මතය. රජ තෙමේ 'භූපති' පෘථිවියේ ස්වාමියා හෙවත් 'භූපළ' පෘථිවියේ ආරක්ෂකයා විය. නැතහොත් පසු කාලයක ලියවුණ නීති නිඝණ්ඩුවෙහි දක්වෙන පරිදි මනුෂ්‍යයින්ගේ පළමුවන රජු වූ මනු වෛවස්වත ද සියලුම දෙනාගේ අධිපති විය. නාරදගේ නීති සංග්‍රහය හා විෂ්ණු ස්මෘතිය අනුව රජුගේ ආදායම ඔහුගේ යටත් වැසියන්ගේ ආරක්ෂාව සඳහා විය.[11]

මේ අනුව රාජකාරිය ක්‍රමයෙහි ගැබ්වුණ ඉතාම වැදගත් මූලික ලක්ෂණය වූයේ ඉඩම් භුක්ති විඳින්නන් විසින් ඉටු කළ යුතු වූ පෞද්ගලික සේවයයි. රාජ්‍ය පාලන තන්ත්‍රය බොහෝ දුරට රඳා පැවතුණේ මෙම සේවා ක්‍රමය මතය. රාජධානියේ තිබූ ඉඩම්වලින් වැඩි කොටසක් භුක්ති විඳින ලද්දේ ද මෙම පදනම මතය.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ  මුළු රටම රජතුමාට අයත් වූ අතර, ඔහු මුදලක් උදෙසා නොව සේවාව ලබා ගැනීම සඳහා සිය ඉඩම් රටවැසියාට පවරා දුන් බවයි. මේ අනුව මහජනයා රජතුමාගෙන් ලැබූ ඉඩම් භුක්ති විඳින අතර, ඒ වෙනුවට නොයෙක් අන්දමේ සේවා ඉටු කළහ. සමහරු යුද්ධවලදී රජතුමාට සේවය කළහ. සමහරු කම්කරුවන් වශයෙන් ඔහුට සේවය කළහ. තවත් සමහරු රජතුමාගේ මාළිගයට භවභෝග සපයන සේවකයන් වශයෙන් සේවය කළහ.[12] සෑම දෙයක්ම වියදමක් නොමැතිව කරන ලද අතර, සෑම කෙනෙකුටම ඔහුගේ මහන්සියට සරිලන පරිදි ගෙවනු ලැබීය. එනම්, ඔවුහු ඒ වෙනුවෙන් ඉඩම් භුක්ති වින්දහ.

රාජකාරිය ක්‍රමය යටතේ ලංකාව ස්වයංපෝෂිත ආර්ථිකයක් ලෙස පැවතුණි. සෑම ගමකම වැසියෝ එම ප්‍රදේශයට අවශ්‍ය දෑ එහිම නිපදවා ගත්හ. මිනිසුන් චාම් ජීවිතයක් ගත කළ නිසා

---

[10] ඇඳගම, එම්. බ්‍රිතාන්‍යයින් යටතේ ශ්‍රී ලංකාවේ සාමාජීය හා ආර්ථික වර්ධනයේ පදනම, ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය, සෝමරත්න, ජී.වී.පී. සංස්කරණය, කොළඹ, විශ්වවිද්‍යාලයේ දේශපාලන විසා අංශයේ ප්‍රකාශනයකි. 1997, 187 පිටු.

[11] කොඩ්රිංටන්, එච්.ඩබ්. ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා ආදායම්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1980, 7 පිටුව.

[12] වැන්ඩන්ඩ්‍රියන්, අයි.එච්. දහනව වැනි සියවසේ ලංකාවේ ආර්ථික ඉතිහාසය, පළමු කාණ්ඩය, සමන් ප්‍රකාශකයෝ, 1963, 97 පිටුව.

අවශ්‍යතා ද සීමිත විය. සාමාන්‍ය වැසියන් ගතකළ චාම් ජීවිතය සහ සරල ජීවන රටාව අනුව මුදල් භාවිතයක් දක්නට නොලැබිණි.

තවද, රාජකාරිය ක්‍රමය යටතේ භූමිය හා වැසියා අතරත්, දැඩි සම්බන්ධතාවක් තිබූ බව පෙනේ. මෙම ක්‍රමය යටතේ මිනිසුන් සේවය කළේ මුදල් උපයා ගැනීමේ අදහසින් නොව යුතුකමක් හෝ වගකීමක් වශයෙනි. සාමූහික වශයෙන් කටයුතු කිරීම නිසා එකමුතු බවක් ද තිබුණි. එබැවින් ගොවිතැන් කටයුතු හා වැව් අමුණු ඉදි කිරීම් හා නඩත්තු කිරීමේ කටයුතු ද සාර්ථක ලෙස කරගත හැකි විය. අප රජරට ශිෂ්ටාචාරය දෙස බලන විට අහස උසට බැඳි මහ දාගැබ් ඉදිකිරීමට ද සයුර පරදවන මහ වැව් ඉදිකිරීමට ද එකල තිබූ රාජකාරිය ක්‍රමය මහෝපකාරී වූවාට සැක නැත.

මෙහිදී රජු භූපති වශයෙන් ප්‍රධානත්වයෙන් සැලකීම නිසා ජනතාව රජුගේ අතට නිරන්තරයෙන් ම කීකරු වීම අනිවාර්ය විය. මෙලෙස රාජකාරිය ක්‍රමය පැවතියත් කිසියම් නියමිත ප්‍රමාණයකට වඩා සේවය ලබාගත් විට විවිධ අවස්ථාවල විශේෂ දීමනා හා වැටුප් දුන් බව සඳහන් වේ.[13] එහිදී එක් අවස්ථාවකදී ලෝවාමහාප්‍රාසාදය කරවීමේදී දුටුගැමුණු රජු විසින් කම්කරුවන්ට වැටුප් ගෙවූ අවස්ථාව ඊට කදිම නිදසුනකි.

> ''මෙහි නොමිලයේ කරන කර්මයක් නොකට යුතු යැයි කියා අගය කරවා ඊට කම්කරුවන්ට වැටුප් මිල දෙවුයේ ය.''[14]

මීට අමතරව විවිධ දීමනා දුන් බව පහත ප්‍රකාශය මගින් පැහැදිලි වෙයි. එනම්, මෙහි නොමිලයේ කර්මයක් නොකටයුතු යැයි දක්වූවෝය. එක එක දොර දොළොස් ලක්ෂයයක් බැගින් කහවණු ද බොහෝ වූ වස්ත්‍ර ද තැබ්බවූයේය. නානාප්‍රකාර වූ ආහාර පාන වර්ග සහිත වූ භෝජනයෙන් ද, සුවඳ මල් උක් සකුරු ආදිය ද මුව සුවඳ කරන්නා වූ තකුල් කපුරු ආදීහු භෛෂජ්‍යය පංචකයද රිසි වූ පරිද්දෙන් කර්මාන්තය කොට ඒ දෙය රිසි සේ ගනිත්වයි කියා තැබ්බ වූයේය. රජුගේ එම කම්කරුවෝ එසේම බලා දුන්හ.[15] මෙලෙස වැඩි ශ්‍රමයකට වැටුප් දුන් බව සඳහන් වේ.

රටවැසියාට යහපත සැලසීම රජුගේ යුතුකම වූ නිසා කෘෂිකර්මය හා වාරි කර්මාන්ත දියුණුවට රජවරු විශේෂයෙන් උනන්දු වූහ. එහිදී මුලදී කුඩා වැව් ඉදි කිරීමට ශ්‍රමය සුළුවෙන් අවශ්‍ය වුවත් පසුකාලීනව මහා වැව් ඉදිකිරීමත් සමඟ, ශ්‍රමය විශාල වශයෙන් අවශ්‍ය විය. ඒ සඳහා විශාල ජනකායක් පහසුවෙන් එක්රැස් කළ හැකි වූයේ රජකුට පමණි. ''භූපති'' වශයෙන් හැඳින්වූ රජු මෙහිදී අනිවාර්යය සේවාව මගින් වැව් ඉදි කිරීමට අවශ්‍ය සේවාව ලබා ගත්තේය. අනුරපුර

[13] ඇඳගම, එම්. ශ්‍රී ලංකාවේ ගම් සහා ක්‍රමයේ ඉතිහාසය, දිවුලපිටිය, 1997, 52 පිටුව.

[14] මහාවංසය, සිංහල, සංස්කරණය ශ්‍රී සුමංගල නායක හිමියන් වහන්සේ සහ ආචාර්ය බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමන්, කොළඹ, 1996, 27 පරිච්ඡේදය, 125 පිටුව.

[15] එම, 30 පරිච්ඡේදය.

අවදියේදී මෙසේ පැවති රාජකාරිය ක්‍රමය මිනිසාට සැබවින්ම බරක් නොවීය. මහජන සුබසිද්ධිය සඳහා කෙරෙන පොදු වැඩ වලදී එය පුණ්‍යකර්මයක් වශයෙන් සැලකීමට එකල පාලකයින් මෙන්ම ජනතාව ද පුරුදුව සිටියහ. එහිදී ගම් මට්ටමින් පොදු වැඩ කිරීමේදී එය රාජකාරියට වඩා තමාගේ කාරියක් වශයෙන් සැලකු බව පෙනේ. ඉහත කරුණු අනුව විශාල වැඩ කටයුතු කිරීමේදී පවා ජනතාව තලා පෙළා වැඩ නොගැනීමටත්, පුද්ගලයින් කැමති ප්‍රමාණයක් පමණක් නොමිලයේ සේවය ලබා ගැනීමටත් රජවරු වග බලා ගත්හ. මේ අනුව රජය හා ජනතාව අතර ඇති වූ අන්‍යෝන්‍ය විශ්වාසය මත මුළු සමාජය විසින් ම පිළිගත් පොදු පිළිවෙතක් වශයෙන් රාජකාරිය සේවාව පැවති බව පෙනේ.

රාජකාරිය දෙස බලන විට එය මූලික වශයෙන් මෙහෙයවන ලද්දේ එකල ගමේ වැදගත් කාර්යයක් කිරීමට මූලිකව ක්‍රියා කළ ගම්සභාව මගිනි. ගම්සභාවේ ආරම්භය පිළිබඳව ප්‍රචලිත මතය වනුයේ එය ක්‍රිස්තු පූර්ව 5 වන සියවසේදී පමණ ලක්දිව ජනාවාස ආරම්භ කළ ආර්යයන් විසින් මෙරටට හඳුන්වා දෙන ලද සංස්ථාවක් බවයි. මෙම සභාව මගින් ගමේ පොදු පාරවල්, වෙහෙර විහාර, අම්බලම්, ඇලවේලි ආදිය ඉදිකිරීම හා නඩත්තු කිරීම සිදුවිය. මෙහිදී අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යටතේ ගම්මුලාදෑනින්ගේ මාර්ගයෙන් ඉහත කටයුතු සිදු කෙරුණි. ගමේ ප්‍රධාන මෙන්ම අත්දැකීම් බහුල මිනිසුන්ගෙන් සමන්විත ගම් සභාව අම්බලමක හෝ සෙවන ඇති ගසක් යට රැස්විය.[16] මෙහිදී අනිවාර්ය සේවා රාජකාරිය ක්‍රමය මගින් ශ්‍රමය සපයා ගැනීමේදී ගම් මුලාදෑනියා සහ ගම්වැසියා අතර පැන නැගුණ ප්‍රශ්න විසඳීමේ කාර්යය පැවරුණේ ද මේ ගම්සභාව වෙතය.

ඉහත සඳහන් කළ රාජකාරිය ක්‍රමයට ගෙවීම් කළේ ඉඩම් ප්‍රදාන මගිනි. ඉඩම් ප්‍රදාන ගම් වශයෙන් හෝ පංගු වශයෙන් කෙරිණි.[17] සෑම ගමකම වගා කළ බිම් ප්‍රමාණය පංගු වශයෙන් බෙදා තිබුණි. පංගුව යනු කිසියම් පවුලක යැපීම සඳහා ප්‍රමාණවත් වන ඉඩම් කොටසකි. ගමක් සාමාන්‍යයෙන් වී ගොවිතැන් කළ කුඹුරු යායකින් ද, ගෙවතු හා ගෙවල්වලින් ද කටුසර භෝග වගා කළ හේන් යායකින් ද යුක්ත විය. සෑම පංගුකාරයෙක් ම තමන් භුක්ති විඳින ඉඩමේ ප්‍රමාණයට අනුව රජුට සේවාවන් කළ යුතු වූ අතර, වාර්ෂිකව දීමනාවක් ද දිය යුතු වූයේය. සේවාව බොහෝ විට කුලය හා සම්බන්ධව පැවතුණි. පංගුකරු සිය ජීවිත කාලය මුළුල්ලේම රජු වෙනුවෙන් නියම කරනු ලැබූ සේවාව කළ යුතු වූයේය. මළපාලුවක්[18] හෝ අතහැර යාමක් වූ විට එකී පංගුව වෙනත් අයෙකුට පැවරුණි.[19] පවුල් වැඩී යාමත් සමඟ නිශ්චිත පංගුවේ අස්වැන්න ප්‍රමාණවත් නොවූ විටක ඉඩම් වඩා කිරීමට හෝ අලුත් ප්‍රදේශයක වෙනත් ඉඩමක්

16 කොඩ්රිංටන්, එච්.ඩබ්. ඉහත සඳහන් ග්‍රන්ථය, 3 පිටුව.

17 අබයසිංහ, ටිකිරි බණ්ඩා හේරත්, පරංගි කෝට්ටේ, කොළඹ, 1966, 93 පිටුව.

ද සිල්වා, එම්.යූ. ඉහත සඳහන් ග්‍රන්ථය, 5 පිටුව.

18 මළපාලුව - උරුමකාරයෙක් නැතුව පංගු හිමියෙක් මළ විට යෙදූ පදය. එය අනුව රාජකාරිය කරන්නන් මිය ගිය හෙයින් එම රාජකාරිය ඉටු කිරීමට කිසිවෙකු නැති නිසා රජය ආපසු ගත් ඉඩම් ය.

19 ද සිල්වා, එම්.යූ., ඉහත සඳහන් ග්‍රන්ථය, 6 පිටුව.

අස්වැද්දීමට අවකාශ තිබුණි. එසේ වුවද, අස්වැද්දූ ඉඩම් වෙනුවෙන් රජුට නියමිත රාජකාරියත් කළ යුතු විය.

රාජ්‍ය නිලධාරීන් සඳහා රජු විසින් කළ ප්‍රදාන වර්ග දෙකකි. පරම්පරාගතව පැවරෙන සේ කෙරෙන ප්‍රදානය පරවේණිය[20] නම් වේ. නිල පංගුකරුගේ සේවා කාලය අවසන් වීමෙන් හෝ අහෝසි වන ප්‍රධානය නිල පංගුව නම් වෙයි.[21] මෙම නිල පංගුකරුගේ අභාවයත් සමග ඉඩම් වෙනත් අයෙකුට ප්‍රදානය කෙරිණි.

භූපති වශයෙන් හැඳින්වෙන රජුගේ ඉඩම්වල ආධිපත්‍යය දෙස බලන විට රජතුමාට අයත් ගම් ප්‍රධාන කොටස් දෙකකි. එනම් ගබඩාගම් හා විදාන ගම් වශයෙනි.[22] ගබඩාගම් රජුගේ ගබඩාව හෝ රජ මෙහෙසියන්ගේ කුමාරවරුන්ගේ ගබඩාව වූ පල්ලේවහල ගබඩාවට හෝ අයිති විය. මෙම ගබඩාගම් රජතුමා සතුව හෝ රජ කුලයකට අයත් වෙනත් පුද්ගලයෙකු හෝ සතුව පැවතිණි. විදානේගම යන්න නිලයේ සිටින දිසාවේවරයෙකු හෝ රජුගේ විදානේ වැනි වෙනත් ප්‍රධානියෙකු විසින් පාලනය කරනු ලබන ගමකි. සිද්ධස්ථානවලට අයිති වූ නින්දගම් විහාරගම් හෝ දේවාලගම් විය.

විහාරස්ථාන හෝ ආගමික නිකාය උදෙසා ඉඩම් පරිත්‍යාග කළ සැදැහැවත් රජවරුන් පිළිබඳව මහාවංශයේ එයි. පූජනීය ඉඩම් රජයට බදු ගෙවීමෙන් හෝ රාජකාරිය ඉටු කිරීමෙන් නිදහස් කරන ලදි. එනිසා මෙවැනි ඉඩම් පරිත්‍යාග සඳහා රජුගේ අවසරය කලින් ලබාගත යුතු විය. ඇතැම් අවස්ථාවල කොටසක් පූජ්‍ය ස්ථානයට පරිත්‍යාග කරන නමුත්, සමහර ඉඩම් හිමියෝ සම්පූර්ණ ඉඩම වෙනුවෙන් රාජකාරිය ඉටු කරයි. රාජකාරිය වෙනුවෙන් පුද්ගලයෙකුට පවරා දෙනු ලැබූ ඉඩමක් එම රාජකාරිය නොකළ විට රාජසන්තක වන්නාසේම පාලුවට ගිය පූජ්‍ය ස්ථාන සතුව තිබූ දේපොල ඇතැම් අවස්ථාවලදී රාජසන්තක විය. එහෙත් සැදැහැවතුන් රජවරු පාළුවූ පූජ්‍ය ස්ථාන ප්‍රතිසංස්කරණය කර ඒවා සතුව තිබූ ඉඩකඩම් නැවත පූජා කළහ. මේ අයුරින් පූජා කළ විහාරගම් වෙනුවෙන් භික්ෂූන් වහන්සේලා මුදලින් හෝ සේවයෙන් හෝ රාජකාරියක් නොකළහ. පූජනීය ඉඩම් අතරින් විශාලම ඒවා වූයේ දේවාලගම්ය. මේවාට අයත් සේවාව ලබා ගැනීම සඳහා තිබූ ක්‍රමයට ප්‍රධානීන් රාශියක් අඩංගු වූ බැවින් දේවාලගම්වල සංවිධානය ආකූල එකකි.

[20] පරවේණිය - පරිවේණිය හෙවත් සංස්කෘත ප්‍රවේණිය යන්නේ අදහස් කරන්නේ මුතුන්මිත්තන්ගෙන් උරුම වී ඇති දෙයකි. ලංකාවේ දෙමළ බසින් එය හඳුන්වන්නේ පරවේණිය යනුවෙනි. සංස්කෘත ප්‍රවේණිය යන්නට ගොතන ලද කෙස් කළඹක් යන අර්ථය ඇත. කලි පවෙණි යන වචනයට මාලාව, උරුමය, පෙලපත, සම්ප්‍රදාය, චාරිත්‍ර, පුරුද්ද යන අර්ථද ඇත. පරවේණිය යනු දිගුකලක් තිස්සේ පවුලට අයත්ව පැවති එක් ඉඩම් හිමියෙකුගේ පෞද්ගලික දේපල වශයෙන් ඩොයිලි නිර්වචනය කරයි. එහෙත් මෑතකදී ලබාගත්තේ වුව ද සීමා රහිත අයිතිය ඇති ඉඩමක් ද එසේ හඳුන්වනු ලැබෙතැයි හෙතෙම පවසයි. (කොඩ්රිංටන් එච්.ඩබ්. ඉහත සඳහන් ග්‍රන්ථය, 15 පිටුව.)

[21] ද සිල්වා, එම්.යූ. ඉහත සඳහන් ග්‍රන්ථය, 7 පිටුව.

[22] කොඩ්රිංටන්, එච්.එම්. ඉහත සඳහන් ග්‍රන්ථය, 36 පිටුව.

ඉහත සඳහන් රාජකාරිය ක්‍රමයන් සඳහා රජු විසින් ඉඩම් පවරා දුන් ආකාරය පිළිබඳව විමසීම ද ඉතා වැදගත් වෙයි. ඒ අනුව සෙල් ලිපි සන්නස් රාශියකින් ඉඩම් ප්‍රදානය පිළිබඳව අපට තොරතුරු ලැබේ.[23] එම කටයුත්ත සඳහා යවනු ලැබූ නිලධාරීහු නියමිත ස්ථානයේදී හමුවී අතපැන් වඩා ඉඩම් පවරා දුන්හ. මොවුන් අසල්වැසි ප්‍රභූන් ඉදිරියේ ඉඩම්වල සීමා සොයා බලා එම සීමා දක්වනු කණු හෙවත් සීමා පහන් සිටුවා ඉඩම් පිරිනැමූ බව සඳහන් වේ.[24] කෝට්ටේ සමයේදී තඹ සන්නස් මගින් ඉඩම් පවරා දුන් බවට සාක්ෂි එයි. එයට නිදසුනක් ලෙස සේවය සඳහා නඩත්තුව වශයෙන් ඔරුවල ග්‍රාමය බ්‍රාහ්මණයන් දෙදෙනෙකුට ලැබුණ බව ඔරුවල සන්නසේ සඳහන් කොට ඇත.[25] කන්ද උඩරට පාලනය යටතේ ද රජු විසින් දේපොළ ප්‍රදානය කරනු ලැබුවේ මුලින් වදාරා හෝ කැට සාක්ෂියෙනි.[26] මෙම වර්ගයේ තාවකාලිකව පිරිනැමූ ගමක් සඳහා රජු විසින් නිශ්චිත වශයෙන් සන්නසක් ප්‍රදානය කරන්නේ නම් එය පරවේණියක් වන බව නින්දගම් පිළිබඳව අදහස් දක්වන ඩොයිලි පවසයි.

ඉහත සඳහන් කරුණු අනුව සිංහල රාජ්‍ය පාලන අවදියේදී රාජකාරිය ක්‍රමය සමස්ත වශයෙන්ම මුළු රටේම දේශපාලන, සමාජ, ආර්ථික ක්‍රමවල පදනම විය. ඉඩම් රජයෙන් ලබා ගනිමින් ඒවා භුක්ති විඳින්නා විසින් රජයට සේවය කළ යුතුව තිබූ නිසා රාජකාරිය සේවා ක්‍රමය එක අතකින් පුද්ගලයාට නොව ඉඩම හා බැඳී පැවතුණි. යම්කිසි ඉඩමක් භුක්ති විඳි තැනැත්තා එම ඉඩම උදෙසා නියමිත රාජකාරිය සේවය ඉටු නොකර පැහැර හැරි විට එම ඉඩම නිලපාලු ඉඩම් බවට පත් වේ.[27] නමුත් එම ඉඩම් නැවත රජයට පවරාගෙන රාජකාරිය සේවාව කිරීමේ පොරොන්දුව පිට වෙන පුද්ගලයෙකුට පවරා දීමට ඉඩ තිබුණි. රාජකාරිය සේවාව ඉටු කළ යුතුව තිබුණේ පුරුෂයින් පමණක් නිසා රීතියක් ලෙස රාජකාරිය ඉඩම් භුක්ති විඳිය හැකි වූයේ පුරුෂයින්ට පමණි.

ඉහත කරුණු අනුව ඉඩම් භුක්තියේ පදනම රාජ්‍ය තන්ත්‍රයට ඇදී තිබුණේය. මේ නිසා රජු ඉඩකඩම් පිළිබඳව කරුණුවලදී තමාට රිසි අන්දමින් ඉඩම් ලබා ගත් අත්තනෝමතික පාලකයෙකු වී යැයි නොසිතිය යුතුය. වැව් හා ලෙන් උදෙසා යම් යම් ගෙවීම් පැරණි රජවරු විසින් කරන ලද බවට පැරණි සෙල්ලිපි සාක්ෂි දරයි. ප්‍රමාණවත් හේතු නොමැතිව ගත් ඉඩම් සඳහා ද මේ රීතිය බලපාන්න ඇතැයි සිතිය හැකිය. හිතුවක්කාර ලෙස ඉඩකඩම් ආදිය අත්කර ගැනීම පිළිගත් හෝ අනුමත නොකළ කරුණක් වූ හෙයින් රජකු තමාටම අයත් දෙයක් මිලදී ගැනීම පිළිබඳව සඳහන් වීම ඉතා වැදගත් කරුණකි. රාජධානියේ අගනුවරට ඉතා ආසන්නව පිහිටි විශාල ඉඩම් යායවල් සමූහයක්ම රජතුමා සතු විය. ගබඩාවේ බිසෝගම් රජු සතු ඉඩම්

23 De silva, Colvin. R. Ceylon under the British Occupation, 1976-1833, Vol. 2, Colombo, 1962, p. 408.

24 කොඩ්රිංටන්, එච්.ඩබ්. ඉහත සඳහන් ග්‍රන්ථය, 40 පිටුව.

25 කොඩ්රිංටන්, එච්.ඩබ්. ඉහත සඳහන් ග්‍රන්ථය, 40 පිටුව.

26 කැට සාක්කිය - පිහියක් හෝ කඩුවක් වැනි යම්කිසි සංකේතයක් දීමෙන් හෝ ලියවිල්ලක් මගින් දේපොල ප්‍රදානය කිරීමයි. කොඩ්රිංටන්, එච්.ඩබ්. ඉහත සඳහන් ග්‍රන්ථය, 41 පිටුව.

27 අබයසිංහ ටිකිරි බණ්ඩා හේරත්, ඉහත සඳහන් ග්‍රන්ථය, 65 පිටුව.

වලට අඩංගු විය. විහාර දේවාල ගම්වල සහ නින්දගම්වල ප්‍රධානීන්ට දී තිබූ ඉඩම්වල වාසය කළ ඉඩම් හිමියන් කෙරෙහි රජුගේ පාලනය බලපෑවේ සුළු වශයෙනි. ඉඩකඩම් වැනි දේපොල අරබයා කෙනෙකුට ඒවායේ අයිතිය ලැබුනේ ඒ වෙනුවෙන් ඉටුකළ යුතු සේවය (රාජකාරිය) අනුවය. මෙම රාජකාරිය වාර්ෂික බුං ඔප්පු කිරිමේ[28] චාරිත්‍රානුකුල සේවයේ සිට ඉතා දුෂ්කර ශ්‍රමික කටයුතු දක්වා විවිධ විය. මෙහිදී රාජකාරිය ඉටු නොකළ විට ඉඩම පුරප්පාඩු වෙයි. අලුතින් අයිතිවාසිකම් කියන්නා එයින් පසුව එම ඉඩම සඳහා වූ රාජකාරිය කළ යුතුය. මේ ආකාරයට රාජ්‍ය ඇතුළත වූ මිනිසුන්ගේ ශ්‍රමය රාජ්‍ය සේවය සඳහා යොදවා ගැනීම මගින් රාජකාරිය සේවාවන් ක්‍රියාත්මක කරනු ලැබීය.

ඒ අනුව සමාජය බෙදා තිබුණ කුල භේදය උඩ එක් එක් කුලයකට විශේෂ රාජකාරිය සේවාවන් ඉටු කළ යුතුව තිබුණි. මේ තත්ත්වය යටතේ රජුට ඉටු කළ යුතු වූ කාර්යයන් පරිපාලන සේවාවේ සිට කුඩා සේවා දක්වා ව්‍යාප්ත විය. පැරණි ශ්‍රී ලාංකික සමාජයේ සමස්ත දේශපාලනික, සමාජ, ආර්ථික ක්ෂේත්‍රවල කැපී පෙනුන ප්‍රධානතම ලක්ෂණය වූයේ කුල ක්‍රමයයි. මෙම ක්‍රමය පසුකාලීනව කුල භේදයක් බවට පත්වූ නමුත් පැරණි දේශීය ක්‍රමය යටතේ එය කුල භේදයක් නොව එක්තරා ශ්‍රේණි ක්‍රමයක් වූයේය. සමාජයේ සෑම කුලයකටම නියමිතව කාර්යභාරයක් පැවරී තිබුණ අතර, ස්වයංපෝෂිත සහ ජීවන සමාජ ක්‍රමය පවත්වාගෙන යාම සඳහා ඒ ඒ කුලවලට පැවරී තිබූ කාර්යය අනිවාර්යයෙන්ම කළ යුතු විය. මෙම කුල ක්‍රමය යටතේ විවිධ පුද්ගලයින්ගේ සමාජ, තරාතිරම වෙනස් වූවා පමණක් නොව විශේෂයෙන්ම ආවාහ විවාහ කටයුතු වැනි සමාජ සම්බන්ධතා වලදී විවිධ කුල අතර, කිසිදු සම්බන්ධතාවයක් ඇති නොවීය. උසස් කුලවල අය හා පහත් කුලවල අය එකට ඉඳගෙන ආහාර ගැනීම සිදු නොවීය. තවද, ඇඳුම් පැළඳුම් හා සමාජ හැසිරීම් රටා මගින් විවිධ කුල එකිනෙකින් වෙන් කොට හඳුනා ගත හැකිය. සමාජ තරාතිරම අනුව, උසස් හෝ පහත් වශයෙන් කුල වෙන්කොට හඳුනාගත් නමුත් සමාජ ක්‍රමයේ පැවැත්ම සඳහා සෑම කුලයකටම කාර්ය පැවති බැවින් සෑම කුලයක්ම වැදගත් සමාජීය ඒකකයක් වූයේය. මේ අනුව පැරණි සමාජය තුළ කුල අතර විවිධ ගැටීම් හෝ භේද ඇති නොවීය. නමුත් බටහිර ජාතීන්ගේ පාලන සමය ආරම්භ වීමත් සමඟ ලංකාවේ පැවති රාජකාරිය ක්‍රමය හා සම්බන්ධව පැවති කුල ක්‍රමය කුල භේදයක් බවට වර්ධනය විය.

**සමාලෝචනය**

රාජකාරිය ක්‍රමය ජනතාව විසින් පිළිගෙන තිබූ සමාජ සම්ප්‍රදායෙන් බැහැර කළ නොහැකි දෙයක් වූ බව පෙනේ. නමුත් එය අපට පෙනෙන්නේ මිනිසුන් බැඳ දමන පීඩාකාරී වූ දෙයක් බවයි. නමුත් පුරාණ සමාජයේ ගසට පොත්ත මෙන් රාජකාරිය ක්‍රමය එකිනෙකට බැඳී තිබුණි.

---

[28] බුං ඔප්පු කිරීම - බුලත් හුරුල්ලක් පිදීමයි. නිශ්චිත වශයෙන් කියනවිට මෙය බුලත් කොළ 40 කින් සැදුණ බුලත් අතකි. එහෙත් සාමාන්‍යයෙන් එය පඬුරුත් සමග දෙනු ලැබේ. (කොඩ්රිංටන්, එච්.ඩබ්. ඉහත සඳහන් ග්‍රන්ථය, 68 පිටුව)

කෙසේ වෙතත් මෙම රාජකාරිය ක්‍රමය නිසා ජනතාවට පීඩාවක් විඳීමට සිදු වූවාට නම් සැකයක් නැත. කුල ක්‍රමය මත මෙය ක්‍රියාත්මක වීම නිසා ජනතාව ක්‍රියාවෙන් නොව උපතින්ම රාජකාරිය සේවයට බැඳී සිටිය යුතු විය. එමෙන්ම මෙම රාජකාරිය සමාජය තුළ තමාට කැමති තැනක යාමට පදිංචි වීමට හෝ වෘත්තියක් තෝරා ගැනීමට අවසරයක් නොවීය. සාම්ප්‍රදායික නීතිරීති මගින් මිනිසාගේ නිදහස සීමා කර තිබුණි. රාජකාරිය ක්‍රමය යටතේ ශ්‍රමය නිදහස් නොවූ බැවින් ශ්‍රම සංචලතාවකට ද බාධා පැමිණින. රාජකාරිය ක්‍රමය යටතේ රජුට යුතුකම් ඉටු කිරීම වෙනුවෙන් ඉඩම් ලැබුණද, තමන් භුක්ති විඳි ඉඩම් වෙනුවෙන් නීත්‍යානුකූල අයිතියක් ඒවායේ නිවැසියන් වෙත නොවීය. එපමණක් නොව ඔවිහු නිරන්තරයෙන්ම භූමියට ඇලී ගැලී වාසය කළෝය. ඉහත ආකාරයට ඉඩම් භුක්ති ක්‍රමය හා කුල ක්‍රමය මත පැවති රාජකාරිය ක්‍රමය මගින් ජනතාවට පීඩාවක් වූ බව අපට පෙණුන ද, එකල සමාජය දෙස බලන විට සත්‍ය වශයෙන්ම එය ඔවුන්ගේ ශ්‍රමය හා එක්ව පැවතුණි. ඒ නිසා පුරාන සිංහල සමාජයේ සෑම කාර්යයක් ම පහසුවෙන් කරගෙන යාමට මෙම රාජකාරිය ක්‍රමය ඉතා ප්‍රයෝජනවත් විය. යථෝක්ත කරුණු අනුව රාජකාරිය ක්‍රමය එකල සමාජ සංස්ථාවේ ජීවය වූ බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.